# කාර්යසාධන වාර්තාව

# 2016

## රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

# දැක්ම

**ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සහතික කරනු ලබන ප්‍රධානතම ආයතනය බවට පත්වීම**

# මෙහෙවර

**රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධනය උපරිමත්වයට පත්කිරීම**

**සඳහා, විශිෂ්ඨ පරිචයන් භාවිතා කරමින් යහපත්**

**අභිලාෂයන් සුරක්ෂිත කරනු පිණිස රාජ්‍ය ව්‍යාපාරවල**

**යහපාලනය ශක්තිමත් කිරීම**

## පටුන


**1. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය....1**

1.1 සමාලෝචනය .... 1
1.2 රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් .... 2

**2. 2016 කාලපරිච්ඡේදය තුල රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ඉටු කල ප්‍රධාන කාර්යයන්.....2**

**3. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට යටත් වන රාජ්‍ය ව්‍යවසායන්හි භෞතික කාර්යසාධනය....6**

3.1 මහා භාණ්ඩාගාරයට ගෙවන අයභාර හා ලාභාංශ.... 6
3.2 රාජ්‍ය ව්‍යවසායන් සඳහා අයවැය ප්‍රතිපාදන .... 7
3.4 ක්‍රමෝපායයන් වශයෙන් වැදගත්වන රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය තත්ත්වය.... 7

**4. රාජ්‍ය ව්‍යවසායන්හි කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ දායකත්වය ....8**

**5. මානව සම්පත් කළමනාකරණය....21**

5.1 මානව සම්පත .... 21
5.2 මාණ්ඩලික නිළධාරීන්ගේ තොරතුරු 2016 .... 21
5.3 සේවක සංයුතිය 2016.... 24
5.4 වර්ෂයේ ස්ථාන මාරුවීම් .... 24
5.5 කාර්යය මණ්ඩල පුහුණු වීම් - 2016.... 25

**6. මූල්‍ය කළමණාකරණය ....27**

6.1 2015 හා 2016 වර්ෂ සඳහා අයවැයගත ප්‍රතිපාදන සහ තථ්‍ය වියදම.... 27
6.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම - 2016.... 27

**7. ඇමුණුම් ....28**

ඇමුණුම 01 : වගුව 01- රජය සතු ව්‍යවසායන්හි ආංශික වත්කම් පදනම .... 28
ඇමුණුම 02 :වගුව 02 - කෝප් රැස්වීම් සඳහා සහභාගී වීම් .... 29
ඇමුණුම 03 :වගුව 03 - රාජ්‍ය ව්‍යාවසායන්හි වාර්ෂික වාර්තා භාර දීම.... 30
ඇමුණුම 04 :වගුව 04 - රාජ්‍ය වාණිජ ව්‍යවසායන්ගෙන් ලද අයභාර / ලාභාංශ ආදායම.... 31
ඇමුණුම 05 :වගුව 05 - අයවැය ප්‍රතිපාදන ලබා දීම .... 33
ඇමුණුම 06:වගුව 06 - රාජ්‍ය ව්‍යවසායන් 55 හි මූල්‍ය තත්වය....34

# 1. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය

## 1.1 සමාලෝචනය

රජය සතු ව්‍යාපාරයන්හි යහපාලනයේ පැවැත්ම තහවුරු කිරීම සඳහා 2002.07.22 දින අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දුන් අනුමැතිය අනුව හා 1971 අංක 38 දරණ මුදල් පනතේ පරිපාලන II කොටසේ විධිවිධාන අනුව පිහිටුවා ඇති මූලික රාජ්‍ය ආයතනය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව නැවත ස්ථාපිත කරන ලදී. රජය සතු ව්‍යවසායන්හි අපේක්ෂිත ඉලක්ක හා ප්‍රතිඵල ලඟා කර ගැනීම සඳහා විශිෂ්ඨ ක්‍රමවේදයක් යොදා ගනිමින්, ඒවායේ කාර්යසාධනය ඉහල නැංවීමත්, පොදුජන අපේක්ෂාවන් තහවුරු කිරීමත් සඳහා යහපාලනය ශක්තිමත් කිරීමට සුදුසු ප්‍රතිපත්තීන් පිළිබඳව උපදේශන හා මගපෙන්වීම් ලබා දීමටත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව කැපවී සිටියි.

පරිපාලිත සමාගම්ද ඇතුළුව රාජ්‍ය ව්‍යාපාර හාරසියයකට ආසන්න ප්‍රමාණයක් රටෙහි ක්‍රියාත්මක වන අතර එම ව්‍යාපාර වාණිජ පරමාර්ථ සහිත ව්‍යාපාර හා වාණිජ පරමාර්ථ රහිත ව්‍යාපාර ලෙස ප්‍රධාන වර්ග දෙකකට බෙදිය හැක. එම රාජ්‍ය ව්‍යාපාර අතරින් ආර්ථික වැදගත් කම, මෙහෙයුම් ධාරිතාව, සේවක සංඛ්‍යාව ආදී කරුණු පදනම් කර ගනිමින් ආයතන උපාය මාර්ගික රාජ්‍ය ව්‍යවසායන් ලෙස හඳුනාගෙන ඇත. මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් රජය සතු උපාය මාර්ගික රාජ්‍ය ව්‍යවසායන් 55 හා පරිපාලිත සමාගම්ද ඇතුළත්ව, රාජ්‍ය ව්‍යවසායන් 152 ක් අධීක්ෂණය කරනු ලබන අතර රාජ්‍ය ව්‍යවසායන් 130 ක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරනු ලබයි. 2016 වසර තුලදී රජය සතු වාණිජ රාජ්‍ය ව්‍යවසාය 55 අතුරින් 39 ක් ලාභ උපයා ඇති අතර ඉතිරි 16 පාඩු ලබා ඇත. 2015 වසර සමඟ සංසන්දනයේදී රජය සතු ව්‍යවසායන්හි මුළු වත්කම් ප්‍රමාණය 2016 වර්ෂයේදී සියයට 4.5 කින් වැඩි වී ඇත. (ඇමුණුම I - වගුව 01) රාජ්‍ය ව්‍යවසායන්හි කාර්යසාධනය කාලයත් සමඟ වැඩි දියුණු වී ඇතත් එම ඵලදායීතාව වැඩිදියුණු කරන තාක්ෂණයන් හා ක්‍රමවේදයන් හා භාවිතා කෙරෙන ආයෝජන අඩු වීමත්, පෞද්ගලික අංශය සමඟ තරඟකාරී මට්ටමින් පුහුණු මානව සම්පත ආකර්ෂණය කර ගැනීමට නොහැකිවීමත්, කාර්යසාධනය කෙරෙහි කාර්ය මණ්ඩල වගවීමේ අඩුකම හේතුවෙන් රාජ්‍ය ව්‍යවසායන් උපරිම කාර්යක්ෂමතාවයෙන් මෙහෙයවීමට නොහැකි වී ඇත.

ඉහත තත්ත්වය අවබෝධ කරගනිමින් රජයේ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය තුල බහුවිධ ප්‍රතිපත්තිමය මැදිහත්වීම තුලින් වගකීම වැඩි දියුණුකර ගනිමින්, ස්වතන්ත්‍ර පාලනය හා ඵලදායකත්වය කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත. ඒ සඳහා ප්‍රතිපත්තිමය මැදිහත් වීමක් ලෙස රාජ්‍ය ව්‍යවසායන්, එයට සම්බන්ධ රේඛීය අමාත්‍යාංශ හා මහා භාණ්ඩාගාරය අත්සන් කරන ලද ත්‍රෛපාර්ශ්වීය සාමූහික ගිවිසුම හඳුන්වා දිය හැක. එම සාමූහික ගිවිසුම තුලින් රාජ්‍ය ව්‍යවසාය වලට සිය කාර්යසාධනය අත්පත්කර ගැනීමේ වගකීම් පිළිබඳව හැඟීමක් ඇති කිරීමටත්, විශේෂයෙන් මනා සම්පත් කළමනාකරණය සඳහා ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීම තුලින් මනා සම්පත් උපයෝජනයක් සිදු කර ගැනීමට අපේක්ෂිතය.

මූලික කාර්යසාධන නිර්ණායක කෙරෙහි අවධානය යොමු කිරීමට රාජ්‍ය ව්‍යාපාර සඳහා අවශ්‍ය ස්වයං තීරණ ගැනීමට කාර්යසාධන කළමනාකරණ හැකියාවකින් යුතු කළමනාකරණ මණ්ඩල පිහිටුවා එම කළමනාකරණ මණ්ඩල වෙත බලතල ලබා දීමත් මූලික කාර්යසාධන දර්ශක හඳුන්වා දීමත් රජයේ මූලික බලාපොරොත්තුව වේ.

### 1.2 රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

- රාජ්‍ය ව්‍යාපාර වෙනුවෙන් ප්‍රතිපත්ති සැකසීම
- වාණිජ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා, 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට උපදෙස් දීම
- රාජ්‍ය ව්‍යාපාර වල යහපාලනය ක්‍රියාත්මක කිරීමට අදාලව නව චක්‍රලේඛ හා මාර්ගෝපදේශ නිකුත් කිරීම
- අදාල අමාත්‍යාංශ හා ආයතන වල අමාත්‍ය මණ්ඩල සංදේශ වල සඳහන් යෝජනා අධ්‍යයනය හා විශ්ලේශණය කිරීම
- රාජ්‍ය ව්‍යාපාර වල කටයුතු අධීක්ෂණය හා සමාලෝචනය කිරීම
- ව්‍යවස්ථාපිත මණ්ඩල සහ අනෙකුත් රාජ්‍ය ව්‍යාපාර වල අවශ්‍යතාවය පරිදි අයවැය ප්‍රතිපාදන නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම
- ආයතනික කටයුතු සඳහා අමාත්‍ය මණ්ඩල අනු කමිටු වෙත අවශ්‍ය සහය ලබා දීම
- රාජ්‍ය ව්‍යවසාය හා ඒවායේ පාලිත සමාගම් සඳහා වන ආයෝජන ගිණුම සැසඳීමේ කටයුතු කිරීම
- උපාය මාර්ගික සමාගම් වල විකිණිය හැකි රජය සතු ඉතිරි කොටස් වලට අදාල ගැටළු සඳහා මැදිහත් වීම මඟින් ආයෝජන කළමනාකරණය කිරීම
- රාජ්‍ය ව්‍යාපාරවල අදාල ගැටළු පිළිබඳ සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම හා ඒ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණය පවත්වාගෙන යාම
- රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ පොදු කාරක සභාවේ කටයුතු සඳහා සහභාගී වීම හා සහයෝගය දැක්වීම

## 2. 2016 කාලපරිච්ඡේදය තුල රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ඉටු කල ප්‍රධාන කාර්යයන්

2016 වසර තුළදී, රාජ්‍ය ව්‍යවසායයන් පිළිබඳව භාණ්ඩාගාරයේ ප්‍රධානතම සුපරීක්ෂක හස්තය වශයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ව්‍යවසායයන් සවිබල ගැන්වීම සඳහා පහත සඳහන් ක්‍රියා මාර්ගයන් ක්‍රියාත්මක කර ඇත.

අ) චක්‍රලේඛ නිකුත් කිරීම හා මාර්ගෝපදේශ සංග්‍රහ සඳහා සංශෝධන සිදු කිරීම

රාජ්‍ය ව්‍යවසායයන් පිළිබඳ අධීක්ෂණ හා සුපරීක්ෂක ආයතනයක කාර්යයන් හා වගකීම් ඉටු කිරීමේ ප්‍රමුඛතම විධික්‍රමයක් ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපත්තිමය නියෝග සකස් කිරීම හා ශ්‍රී ලකාවේ රාජ්‍ය ව්‍යවසායයන්ගේ යහපාලනය වර්ධනය කිරීම උදෙසා විෂය ක්ෂේත්‍ර 6 ක් උදෙසා චක්‍රලේඛ 07 ක් නිකුත් කර ඇත. එම චක්‍රලේඛ මගින් ආමන්ත්‍රණය කරන ලද මූලික විෂය ක්ෂේත්‍රයන් පහත පරිදි වේ.

I. 19 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ වගන්ති මගින් උපදෙස් ලබා දී ඇති පරිදි රජය සතු සමාගම් වල විගණනය
II. රාජ්‍ය ව්‍යවසායයන්හි අතිරික්ත සේවකයන් සඳහා වන ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය (VRS)
III. රාජ්‍ය ව්‍යවසායයන්හි සේවකයන්ගේ උපයන විට ගෙවීම් බදු අයකර ගැනීම
IV. රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල නිලධාරින් සඳහා ප්‍රවාහන පහසුකම්
V. රාජ්‍ය ව්‍යාපාර සඳහා මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ප්‍රසම්පාදනය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය
VI. රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට 2016 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීම

තවද, විවිධ රාජ්‍ය ව්‍යවසායයන් විසින් ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්තිමය ගැටළු 200 කට අධික සංඛ්‍යාවක් සඳහා අදාළ වර්ෂය තුළදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් පිළිතුරු ලබා දී ඇත. මීට අමතරව රාජ්‍ය ව්‍යවසායයන්හි යහපාලනය වර්ධනය කර ගැනීම උදෙසා විවිධ කරුණු සම්බන්ධයෙන් දුරකථන ඇමතුම් හරහා දෛනිකව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හා ගැටළු සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිලධාරින් විසින් උපදෙස් ලබා දීම මගින් සහය ලබා දී ඇත.

ආ) පොදු ව්‍යාපාර කාරක සභාවේ (COPE) කාර්යයන් සඳහා සහය වීම

2015 පැවති මහා මැතිවරණයට පසුව 2016 නොවැම්බර් 26 දින නව පොදු ව්‍යාපාර කාරක සභාව පත් කරන ලදී. 2016 වසර තුළ කාරක සභා රැස්වීම් වාර 60 ක් පවත්වා ඇති අතර ඉන් 51 ක් සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සහභාගී වී ඇත. එමෙන්ම කෝප් කමිටුව මගින් රාජ්‍ය ව්‍යාපාර වෙත ලබා දෙන ලද මහ පෙන්වීම්/නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව නිරන්තරව පසු විපරම් සිදු කරනු ලබයි. කෝප් කමිටුවට සහභාගී වීම් පිළිබඳව වාර්තාවක් “ඇමුණුම II - වගුව 02” හි දක්වා ඇත.

ඇ) රාජ්‍ය ව්‍යාපාර මඟින් වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳව පසු විපරම් සිදු කරන ලදී. 2016 වර්ෂය තුළදී පාර්ලිමේන්තුවට වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම පිළිබඳව තොරතුරු "ඇමුණුම III - වගුව 03" හි දක්වා ඇත.

ඈ) 19 වන ව්‍යවස්ථා සංශෝධනයත් සමඟම සියයට 50 ට වැඩි රජයේ හිමිකාරීත්වයක් සහිත රජය සතු ව්‍යාපාරයන්හි පාලිත සමාගම් පිළිබඳව විගණනය කිරීමද විගණකාධිපතිවරයා වෙත පැවරී ඇත. විගණකාධිපති විසින් රජය සතු ව්‍යාපාර හා ඒවායේ පාලිත සමාගම් වල මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව දෙනු ලබන නිරීක්ෂණ ක්‍රියාත්මක කොට පසු විපරම් සිදු කරන අතර අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා එම රාජ්‍ය ව්‍යවසායන් වෙත උපදෙස් ලබා දෙනු ලබයි.

ඉ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් මුදල් පනත, මුදල් රෙගුලාසි හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයන්ට අනුකූලව මුදල් අමාත්‍යවරයා වෙතින් ලබා ගත යුතු අනුමැතින් ලබා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණ කාර්යයන් ඉටු කරන ලදී. මේ යටතට මූලධන වියදම් සඳහා අනුමැතිය ලබා දීම, ණය සීමා ඉහළ දැමීම, බදු සංශෝධන ආදිය අයත් වේ. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මඟින් රාජ්‍ය ව්‍යවසායන් විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සඳහා රජයේ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ඔවුන්ගේ අනුකූලතාවය පිළිබඳ අවධානය යොමු කරමින් මුදල් අමාත්‍යාංශය වෙත නිරීක්ෂණ ඉදිරිපත් කරනු ලැබේ.

ඊ) රාජ්‍ය ව්‍යාපාරයන්හි කොටස්කරුවන්ගේ රැස්වීම්, වාර්ෂික/විශේෂිත මහා සභා රැස්වීම් සඳහා මහා භාණ්ඩාගාරය නියෝජනය කරමින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සහභාගී වූ අතර රජයේ ප්‍රතිපත්තිමය රාමුව අනුව යමින් එම ව්‍යාපාරයන්හි කාර්යසාධනය වැඩිදියුණු කර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් කළමනාකරණය වෙත ලබා දෙන ලදී.

උ) මුදල් අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති මාර්ගෝපදේශ/චක්‍රලේඛ මඟින් ලබා දී ඇති බලතල අනුව රාජ්‍ය ව්‍යාපාර සඳහා වාහන මිලදී ගැනීම, විදේශ ගමන්, අයවැය ප්‍රතිපාදන ලබා දීම හා මුදල් නිදහස් කිරීම ආදියට අනුමැතිය ලබා දෙන ලදී.

ඌ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් රාජ්‍ය ව්‍යවසායන්හි ප්‍රගතිය, කාර්යසාධනය සමාලෝචනය කිරීම සඳහා මෙන්ම මෙහෙයුම් ගැටළු විසඳීමට අදාලව ඒවායේ අධ්‍යක්ෂ මණ්ඩල/ඉහළ කළමනාකාරීත්වය සමඟ මුදල් අමාත්‍යවරයා, භාණ්ඩාගාර ලේකම්, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් හෝ රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීම් සම්බන්ධීකරණය කරමින් ඒවාට සහභාගී වී ඇත.

එ) මුදල් අමාත්‍යාංශය වෙනුවෙන් රාජ්‍ය ව්‍යාපාර වෙතින් නියමිත පරිදි ලාභාංශ හා අයභාර අයකර ගත් අතර නියමිත පරිදි ආදායම් ගිණුම් දෙක සකස් කරන ලදී.

ඒ) රාජ්‍ය ව්‍යාපාරයන්ට අදාලව නොයෙකුත් අමාත්‍යාංශ මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අධ්‍යයනය කිරීමෙන් හා විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ පිළියෙළ කිරීම් පහත "වගුව 2.1" හි දැක්වේ.

**වගුව 2.1: අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ - අංශගත විශ්ලේෂණය - 2016**

| අනු අංකය | අංශය | අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ ප්‍රමාණය |
|---|---|---|
| 01 | බලශක්ති | 37 |
| 02 | වරාය | 20 |
| 03 | ගුවන් සේවා | 12 |
| 04 | ජල සම්පාදන | 8 |
| 05 | මගී ප්‍රවාහන | 14 |
| 06 | ඉදිකිරීම් | 11 |
| 07 | පශු සම්පත් | 6 |
| 08 | වැවිලි | 6 |
| 09 | පුනර්ජනනීය නොවන සම්පත් | 5 |
| 10 | සෞඛ්‍ය | 5 |
| 11 | මාධ්‍ය | 7 |
| 12 | අලෙවි හා බෙදාහැරීම් | 12 |
| 13 | ප්‍රතිව්‍යුහගතකරණය | 11 |
| 14 | ධීවර | 12 |
| 15 | බැංකු | 3 |
| 16 | වාණිජ නොවන | 6 |
| | **එකතුව** | **175** |

*මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

ඔ) රාජ්‍ය ආයෝජන ගිණුම සංසන්දනය කිරීමේ කටයුතු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2014 වසරේදී ආරම්භ කළ අතර ඊට අදාල තොරතුරු රාජ්‍ය ව්‍යවසායන්ගෙන් හා ඒවායේ පාලිත සමාගම් මඟින් රැස් කර ගිණුම් යාවත්කාලීන කරන ලදී.

ඕ) ලංකා විදුලිබල මණ්ඩලය, ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ලංකා ඛනිජ තෙල් සංස්ථාව හා සී/ස ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම යන ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර පහක් සඳහා සාමූහික අවබෝධතා ගිවිසුම් ප්‍රකාශය (SCI) අත්සන් කිරීමට අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කරන ලදී. මෙම සාමූහික අවබෝධතා ගිවිසුම් ප්‍රකාශය ත්‍රෛපාර්ශවීය වේ. ඒ අනුව, භාණ්ඩාගාර ලේකම්, අදාල රේඛීය අමාත්‍යාංශ ලේකම්වරුන් සහ රාජ්‍ය ව්‍යවසායන්හි සභාපතිවරුන් විසින් සාමූහික අවබෝධතා ගිවිසුම් ප්‍රකාශය 2017 මාර්තු 15 වන දින අත්සන් තබන ලදී.

ක) අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව අතිරේක කාර්යය මණ්ඩලය ඉවත් කර රාජ්‍ය ව්‍යාපාර වාණිජමය වශයෙන් ජීව්‍යමය ආයතන බවට පත් කිරීමේ පළමු පියවර ලෙස ස්වේච්ඡා වන්දි ක්‍රමවේදයක් සකස් කර දෙන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ලංකා ධීවර සංස්ථාව, ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, ලංකා සිමෙන්ති සමාගම, ජාතික කඩදාසි සංස්ථාව හා ලංකා සළුසල

යන ආයතන මෙම ස්වේච්ඡා වන්දි ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී. එම යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම ගැන්වීම් පිළිබඳ තොරතුරු පහත "වගුව 2.2" මඟින් දැක්වේ.

**වගුව 2.2 : ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීම් යෝජනා ක්‍රමය පිළිබඳ තොරතුරු**

| අනු අංකය | ආයතනය/රජය සතු ව්‍යවසාය | යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම ගත් සේවක සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | 3,822 |
| 02 | ලංකා ධීවර සංස්ථාව | 273 |
| 03 | ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව | 35 |
| 04 | ලංකා සිමෙන්ති සමාගම | 18 |
| 05 | ජාතික කඩදාසි සංස්ථාව | 148 |
| 06 | ලංකා සළුසල | 194 |
| | **එකතුව** | 4, 490 |

*මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

ග) රාජ්‍ය ව්‍යාපාරයන්හි ශේෂපත්‍රය සවිමත් කිරීම සඳහා 2016 වර්ෂය තුළදී, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, නෝර්ත්සී සමාගම, නාගරික සංවර්ධන අධිකාරිය, විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාව, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ගල් අඟුරු පුද්ගලික සමාගම සහ ලංකා ඛණිජ තෙල් සංස්ථාව වෙත භාණ්ඩාගාර බැඳුම්කර ලබා දීමට අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලදී. ඒ සම්බන්ධ තොරතුරු පහත දැක්වෙන "වගුව 2.3" මඟින් දැක්වේ.

**වගුව 2.3 : නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර පිළිබඳ තොරතුරු - 2016**

| අනු අංකය | ආයතනය | ව්‍යවහාර මුදල | බැඳුම්කර වටිනාකම (මිලියන) |
|---|---|---|---|
| 01 | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | රුපියල් | 11,838.85 |
| | | ඇ.එ.ජ.ඩො | 385.20 |
| | | යූරෝ | 36.48 |
| 02 | නෝර්ත්සී සමාගම | රුපියල් | 50.00 |
| 03 | නාගරික සංවර්ධන අධිකාරිය | රුපියල් | 20,000.00 |
| 04 | විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාව | ඇ.එ.ජ.ඩො | 88.66 |
| 05 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | රුපියල් | 750.00 |
| 06 | ලංකා විදුලිබල මණ්ඩලය | රුපියල් | 8,750.00 |
| 07 | ලංකා ගල්අඟුරු පුද්ගලික සමාගම | රුපියල් | 6,000.00 |
| 08 | ලංකා ඛණිජ තෙල් සංස්ථාව | ඇ.එ.ජ.ඩො | 900.00 |

*මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

# 3. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට යටත් වන රාජ්‍ය ව්‍යවසායන්හි භෞතික කාර්යසාධනය

## 3.1 මහා භාණ්ඩාගාරයට ගෙවන අයභාර හා ලාභාංශ

රාජ්‍ය ව්‍යවසායන්ගෙන් ආදායම් අය කර ගැනීමේ රජයේ ප්‍රතිපත්ති අනුව සියළුම රාජ්‍ය ව්‍යවසායන් විසින් ඔවුන්ගේ ලාභයෙන් අවම වශයෙන් සියයට 30 ක් හෝ යෙදවුම් ප්‍රාග්ධනයෙන් සියයයට 15 ක් යන

දෙකින් වැඩි අගය, වාර්ෂිකව මහා භාණ්ඩාගාරයට ලබා දිය යුතුය. 2016 වසරේ රාජ්‍ය වාණිජ ව්‍යාපාර හැට හයක් විසින්, අයභාර හෝ ලාභාංශ ලෙස රුපියල් බිලියන 108 ක දායකත්වයක් ඒකාබද්ධ අරමුදලට ලබා දී ඇත. එය 2015 වසර සමඟ සංසන්දනයේදී සියයට දෙසිය හැටක වැඩි වීමකි. 2016 වර්ෂයේදී රජය වෙත ලාභාංශ හා අයභාර ලැබීම පිළිබඳ තොරතුරු ඇතුලත් ලැයිස්තුවක් "ඇමුණුම් අංක IV - වගුව 04" හි දක්වා ඇත. පසුගිය වසර හය තුළදී ලාභාංශ හා අයභාර ආදායම් ලැබීම් පිළිබඳ නැඹුරුව පහත "ප්‍රස්තාරය 3.1" මගින් දැක්වේ.

**ප්‍රස්ථාරය 3.1 : ලාභාංශ හා අයභාර ආදායම් 2011-2016**

රු.මි.




*මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

## 3.2 රාජ්‍ය ව්‍යවසායන් සඳහා අයවැය ප්‍රතිපාදන

මහා භාණ්ඩාගාරය විසින් 2016 වර්ෂයේදී රජය සතු ව්‍යවසායයන් 08 ක් සඳහා රු. බිලියන 23 ක් රාජ්‍ය අයවැය ප්‍රතිපාදන සපයා ඇත. 2015 වසරේදී රාජ්‍ය ව්‍යාපාර 12 ක් සඳහා රු. බිලියන 26 ක අයවැය ප්‍රතිපාදන ලබා දී ඇත. පෙර වසර හා සැසඳීමේදී එය සියයට දොළහක (12%) අඩු වීමක් වන අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන් මනා අධීක්ෂණය හා රජය සතු ව්‍යවසායන් සඳහා වූ ප්‍රාග්ධන ප්‍රදාන අඩු වීම හේතුවී ඇත. රාජ්‍ය ව්‍යවසායයන් සඳහා ලබා දුන් අයවැය සහන "ඇමුණුම III - වගුව 05" හි දක්වා ඇත.

## 3.4 ක්‍රමෝපායයන් වශයෙන් වැදගත්වන රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය තත්ත්වය

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් කලින් කල රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය තොරතුරු එක්රැස් කර විශ්ලේෂණය කරන අතර එහි ප්‍රතිඵල අනුව අධ්‍යක්ෂ මණ්ඩල හා කළමනාකාරිත්වය සමඟ සමාලෝචන

සාකච්ඡා පැවැත්වේ. ක්‍රමෝපායික වශයෙන් වැදගත් වන රජය සතු ව්‍යවසායන්හි මූල්‍ය තත්වය "ඇමුණුම V - වගුව 06" හි දක්වා ඇත.

## 4. රාජ්‍ය ව්‍යවසායන්හි කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ දායකත්වය

රාජ්‍ය ව්‍යවසායන්හි කෙටිකාලීන හා මධ්‍ය කාලීන අරමුණු ලබා කර ගැනීම සහතික කිරීම සඳහා පහත දැක්වෙන නිර්දේශ ඉදිරිපත් කර ඇත.

**වගුව 4.1 : රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග හා නිර්දේශයන්**

| අංශය | රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්යසාධනය | ලබා දුන් නිර්දේශ/ගත යුතු ක්‍රියාමාර්ග |
|---|---|---|
| **බලශක්ති අංශය**<br><br>ලංකා විදුලිබල මණ්ඩලය | 2016 වසරේ පැවති වියළි කාලගුණ තත්ත්වය හේතුවෙන්, 2015 වසරේ ජල විදුලිය:තාප විදුලිය (ඉන්ධන):තාප විදුලිය (ගල් අඟුරු) 38:28:34 සිට 2016 වසරේදී 25:40:35 දක්වා බලශක්ති උත්පාදන සංයුතිය වෙනස් වීමේ ප්‍රතිඵලයක් ලෙස 2015 දී රු. 15.06 ක් වූ විදුලි ඒකකයක මිල 2016 දී රු. 17.53 දක්වා ඉහළ ගොස් ඇත. පිරිවැය පිළිබිඹු වන මිල ක්‍රමය තවමත් ක්‍රියාත්මක නොවන හෙයින් ලංකා විදුලිබල මණ්ඩලය 2016 දී රු.මි.14,499 ක මෙහෙයුම් අලාභයක් වාර්තා කර ඇත.<br><br>මහා භාණ්ඩාගාරය විසින් 2016.12.31 දක්වා රු.බි. 85.8 දක්වා ණය ගැනීමේ සීමාව අනුමත කරන ලදී.<br><br>ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගමට අනුයුක්ත කර තිබූ 3,828 සේවකයින් ලංකා විදුලිබල මණ්ඩලයට බඳවා ගැනීම කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලදී.<br><br>2016 සිට අලෙවිය මත 2% ක ජාතිය ගොඩනැඟීමේ බද්ද පැනවීම සහ 2017 අය වැය කථාවට අනුව 2017 වසරේ සිට ගල් අඟුරු ආනයනය සඳහා 15% ක එකතු කල අගය මත බදු පනවන ලදී.<br><br>2016 වසරේදී ඒකාබද්ධ අරමුදලට රු.බි. 05 ක විශේෂ කළමනාකරණ ගාස්තුවක් ලැබුණු අතර එය ඉදිරි වසර 10 තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.<br><br>ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ රු.බි. 8,250 භාණ්ඩාගාර ඇපකර වල වලංගු කාලය දීර්ඝ කරන ලදී. | විදුලි සරයක පද්ධතිය පාලනය කිරීමේ කටයුතු විධිමත් කිරීමට හා එමගින් අඩු පිරිවැය විදුලි සරයක් සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සකස් කරන ලද සරයක විගණන මාර්ගෝපදේශ අනුගමනය කිරීමට ලංකා විදුලිබල මණ්ඩලයට සිදු වනු ඇත.<br><br>රටේ බලශක්ති ප්‍රතිපත්තියට අනුව 2020 වසරේ දී රටේ විදුලි උත්පාදන ධාරිතාවයෙන් අවම වශයෙන් සියයට 20 ක් සාම්ප්‍රදායික නොවන බලශක්ති මූලාශ්‍ර වලින් සපුරාගත යුතු වේ. ඒ අනුව එම ඉලක්ක සපුරාගැනීමට ලංවිම නව්‍ය මූල්‍ය හා ව්‍යුහාත්මක ආකෘති සොයා බැලිය යුතුව ඇත.<br><br>ආර්ථිකය වෙත එකතු වන කර්මාන්ත වැඩිවීමත් සමඟ පසුගිය වසර 05 තුල, විදුලිය සඳහා වන ඉල්ලුම වසරින් වසර දළ වශයෙන් 4.5% ක සාමාන්‍ය වේගයකින් වර්ධනය වෙමින් පවතී. එහෙයින් මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ලංකා විදුලිබල මණ්ඩලයේ දිගුකාලීන විදුලි උත්පාදන සැලැස්ම පරිදි 2018-2034 දක්වා කාලය තුල සෑම වසරකම නිෂ්පාදන ධාරිතාවට අවම වශයෙන් මෙ.වො. 870 ක් පමණ එකතු විය යුතු අතර මේ සඳහා අවම වශයෙන් රු.බි. 20 ක් හෝ ඇ.ඩො.මි. 132 ක් පමණ ආයෝජනය කල යුතුය. |

| අංශය | රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්යසාධනය | ලබා දුන් නිර්දේශ/ගත යුතු ක්‍රියාමාර්ග |
|---|---|---|
| ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව | 2015 වර්ෂයේ වාර්තා කළ රු.බි. 19.4 ක ශුද්ධ අලාභය හා සැසඳීමේදි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව 2016 වර්ෂයේදී රු.බි. 69.6 ක ශුද්ධ ලාභයක් වාර්තා කර ඇත. 2016 වර්ෂයේ අග භාගයේදී ඇති වූ නියං තත්ත්වය හේතුවෙන් විදුලිබල උත්පාදනය සඳහා වන ඩීසල් සහ දැවිතෙල් සඳහා වූ ඉහළ ඉල්ලුම හා මෙම නිෂ්පාදන දෙකම ඉහළ ලාභාන්තිකයක් සහිතව විකිණීම නිසා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලාභය විශාල ලෙස ඉහළ යන ලදී. රුපියලේ අගය බොහෝ දුරට ස්ථාවරව පැවතීම නිසා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මුළු ආනයන වියදම අඩුකර ගැනීමට හැකියාව ලැබුණු අතර 2015 වර්ෂයේ රු.බි. 32.8 ක්ව පැවති විනිමය අලාභය 2016 වර්ෂයේදී රු.බි. 8.8 ක් දක්වා පහත වැටීමටද එම තත්ත්වය හේතු විණි. මෙම තත්ත්වය යටතේ ආයතනයේ මූල්‍ය ප්‍රවාහයේ ඇති වූ වර්ධනය හේතුවෙන් බැංකු දෙක වෙත ගෙවීමට තිබූ ණය ප්‍රමාණයෙන් ඇ.ඩො.මි. 313 ක් ගෙවා දැමීමට හැකි වූ අතර එය ආයතනයේ පසුගිය වර්ෂයට සාපේක්ෂව පොළී වියදම රු.මි. 3,600 කින් හෙවත් සියයට 24 ක ප්‍රමාණයකින් අඩු කර ගැනීමටද හේතු විය.<br><br>වර්ෂය තුළ සිදුවූ මූල්‍ය ප්‍රවාහයේ වැඩි දියුණු වීම සලකා බලා මහා භාණ්ඩාගාරය විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙනුවෙන් ලබාදී තිබූ භාණ්ඩාගාර ඇපකර වටිනාකම ඇ.ඩො.මි. 200 කින් එනම්, ඇ.ඩො.මි. 1,600 ක් දක්වා අඩු කරන ලදී. 2015 වර්ෂයේ බැංකු දෙක සඳහා ගෙවීමට තිබූ ණය ප්‍රමාණය වන ඇ.ඩො.මි. 2,481 හා සැසඳීමේදී 2016 වර්ෂය අවසානයේදී ගෙවීමට තිබූ ණය ප්‍රමාණය ඇ.ඩො.මි. 2,036 ක් දක්වා අඩු වී ඇත. | 2016 වර්ෂයේ විකුණුම් ආදායම ඉහළ ගියද ණය කරුවන් වෙතින් ණය අයකර ගැනීමට නොහැකි වී ඇත. එබැවින්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සිය ණයගැතියන් මනාව කළමනාකරණය කිරීම සඳහා සුදුසු පියවර ගත යුතු වේ.<br><br>මූල්‍ය ශාස්තු ආයතනයේ මෙහෙයුම් ලාභය විශාල ලෙස අවශෝෂණය කර ගනී. එබැවින් රාජ්‍ය බැංකු දෙක වෙත ඇති ණය ප්‍රමාණය විචක්ෂණශීලිව කළමනාකරණය කිරීමේ හැකියාව වර්ධනය කරගත යුතු බවට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව උපදෙස් ලබා දී ඇත . |
| **ජල අංශය**<br><br>ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 2020 වසර වන විට නල ජල සැපයුම දැනට තිබෙන මට්ටමේ සිට 60% දක්වා වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට සුවිශේෂී වූ කාර්යභාරයක් ඉටු කිරීමට සිදුවී ඇත.<br><br>වර්තමානයේ ශ්‍රී ලාංකික ජනතාවගෙන් සියයට 47.7 ක් පමණ ආරක්ෂිත ජලය, නල මාර්ගයෙන් පරිභෝජනය කරන අතර එයින් සියයට 37.2 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබයි.<br><br>නිෂ්පාදන වියදම රුපියල් මිලියන 13,486 ක් දරමින් ජල සම්පාදන ව්‍යාපෘති 337 ක් අධාරයෙන් ජාතික ජල සම්පාදන මණ්ඩලය 2016 වසරේ පානීය ජල ඝන මීටර 649 ක් නිෂ්පාදනය කර ඇති ජල පරිමාව, 2015 වසර තුල නිපදවූ පානීය ජල ඝන | ප්‍රසම්පාදන ක්‍රියාවලීන්හි ඇතිවන ප්‍රමාදයන් හා දුර්වල කළමනාකාරීත්වය හේතුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ක්‍රියාවට නංවන බොහෝමයක් ජල ව්‍යාපෘතින්හි අහේතුක ප්‍රමාදයන් හා විශාල පිරිවැය ඉහළ යාම් දක්නට ඇත. ඒ අනුව, මුදලේ වටිනාකම වැඩි කිරීම සඳහා තම අධීක්ෂණ ක්‍රමවේද හා ව්‍යාපෘති කළමනාකරණය වැඩි දියුණු කිරීමට කටයුතු කරන ලෙස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට උපදෙස් දී ඇත.<br><br>තීරණවල සඵලදායීත්වය, ප්‍රධාන වශයෙන් සපයනු ලබන තොරතුරුවල නිවැරදිතාව හා විශ්වාසනීයත්වය මත පදනම් වේ. එබැවින්, |

| අංශය | රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්යසාධනය | ලබා දුන් නිර්දේශ/ගත යුතු ක්‍රියාමාර්ග |
|---|---|---|
| | මීටර 612 ට සාපේක්ෂව 6% ක වැඩි වීමකි. 2015 වසරේදී ජල ඝන මීටරයක් පාරිභෝගිකයා වෙත සැපයීම සඳහා දැරීමට සිදු වූ රුපියල් 48.00 ක් වූ පිරිවැය 2016 වසරේදී ද එලෙසම පවතී.<br><br>2016 වසර තුල දී බවුසර් හා ජල සම්බන්ධතා 2,092,471 ක් මඟින් ජලය ඝන මීටර 484 ක් බෙදාහැර ඇති අතර එය 2015 වසරේ ජලය ඝන මීටර 442 ට සාපේක්ෂව සියයට 10 ක වැඩි වීමකි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය රුපියල් බිලියන 21.3 ක අදායමක් වාර්තා කර ඇත.<br><br>බෙදාහැරීම් පද්ධතියේ අඛණ්ඩ කාන්දුවීම් හේතුවෙන් 2016 වසර තුල ජල ඝන මීටර මිලියන 165 ක් ආදායම් නොලබන ජලය ලෙස වාර්තා වී ඇති අතර එය මුළු ජල නිෂ්පාදනයෙන් සියයට 25.4 කි. 2015 වසරේ සියයට 28 ක් වූ අදායම් නොලබන ජලය 2016 වසර තුල දී සියයට 25.4 දක්වා අඩු කර ගැනීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හැකි වී ඇත. | ප්‍රමාණවත් හා සුදුසු කළමනාකරණ තොරතුරු පද්ධතියක (Management Information System – MIS) හා වඩා හොඳ ව්‍යාපාර සම්පත් සැලසුමක (Enterprise Resource Plan – ERP) අවශ්‍යතාවය අවධාරණය කර ඇත. |
| **මගී ප්‍රවාහන අංශය**<br><br>ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | කාර්ය මණ්ඩල අතිරික්ත ගැටළුව විසඳීම පිණිස 2016 වර්ෂය තුළ ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීමේ ක්‍රමවේදය හඳුන්වාදුන් අතර එමඟින් 3,822 ක සේවක පිරිසක් විශ්‍රාම ගැන්වීමට හැකි විය. ඒ සඳහා අවශ්‍ය අරමුදල් (රු. මිලියන 6,500) මහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන ලදී.<br><br>රු. මිලියන 11,982 ක්ව පැවති නොපියවූ ව්‍යවස්ථාපිත ගෙවීම් (සේවක අර්ථසාධක අරමුදල් සහ පාරිතෝෂික) 2016 වර්ෂය අවසානය වන විට රු. මිලියන 6,618 ක් දක්වා අඩු කර ගැනීමට හැකියාව ලැබිණි. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නොපියවූ ව්‍යවස්ථාපිත ගෙවීම් පියවීම සඳහා "ප්‍රොවිඩන්ට් ප්‍රොපර්ටි ලංකා ලිමිටඩ්" නමින් ආයතනයක් ස්ථාපිත කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ප්‍රයෝජනයට නොගත් ඉඩම් රු. බිලියන 6 කට වැඩි බැරකම් සමඟ එම සමාගමට හුවමාරු කරන අතර දේපළ විකිණීමෙන් ලැබෙන ආදායමෙන් නැවත මිලදී ගැනීමේ අපේක්ෂාව මත සේවක අර්ථසාධක අරමුදල වෙත එම සමාගමේ හිමිකම් කොටස් හෝ වරණීය කොටස් නිකුත් කරනු ලැබේ.<br><br>මෙහෙයුම් අකාර්යක්ෂමතා මැඩපැවැත්වීම උදෙසා උපාය මාර්ගික ව්‍යවසාය කළමනාකරණය කිරීමේ ආයතනය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ප්‍රවාහන අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරයේ මැදිහත්වීමෙන් ලාභ මධ්‍යස්ථාන මධ්‍යගත සංකල්පයක් සහ මෙහෙයුම් අකාර්යක්ෂමතාව | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට සිය මෙහෙයුම් වඩා කාර්යක්ෂම සහ ඵලදායී ලෙස පවත්වාගෙන යාම තුළින් මෙහෙයුම් මට්ටම වැඩිදියුණු කර ගැනීම සඳහා ආයතනික සම්පත් සැලැස්මක අවශ්‍යතාව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අවධාරණය කර ඇත. එබැවින් පහත සඳහන් කටයුතු කිරීම නිර්දේශ කරනු ලැබේ.<br><br>ධාවනය කළ නොහැකි තත්ත්වයේ තිබෙන බස් රථ ඉවත් කිරීම.<br><br>ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ලාභදායී ආයතනයක් බවට පත් කිරීම සඳහා ව්‍යාපාරික සැලැස්මක් සකස් කිරීම.<br><br>ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීමෙන් පසු සේවකයින් බඳවා ගැනීමේ පරිපාටීන් අනුව නව පිරිස්බල සැකැස්මක් සකස් කර ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගත යුතු බවට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත උපදෙස් ලබා දෙනු ලැබේ. |

| අංශය | රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්යසාධනය | ලබා දුන් නිර්දේශ/ගත යුතු ක්‍රියාමාර්ග |
|---|---|---|
| | පහත හෙළන්නාවූ ආයතන විසින් සංවර්ධනය කරන ලද ආයතනික සම්පත් සැලසුම් පද්ධතියක් (ERP) මගින් හා සාමූහික බස් රථ සංකල්පය මඟින් වැඩිදියුණු කරනලද ව්‍යාපාරික සැලැස්මක් සකස් කරමින් පවතී.<br><br>මහා භාණ්ඩාගාරය විසින් පුනරාවර්තන වියදම් සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට මාසිකව රු. මිලියන 1,350 ක ප්‍රතිපාදන සපයන ලදී. | |
| **ගුවන් සේවා අංශය**<br><br>සී/ස ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ මගී මෙහෙයුම් ධාරිතාව මිලියන 6 ක් පමණ වුවත් 2016 වසරේදී සියයට 60 කට වඩා වැඩි ධාරිතාවයක් එනම් මගීන් මිලියන 9.6 ක් පමණ මෙහෙයවා ඇත. මෙය මගී මෙහෙයුම් කාලය වැඩි වීමට බලපා ඇත. කෙසේ වෙතත් දැනට කෙරෙමින් පවතින බණ්ඩාරනායක ගුවන්තොටුපල පුළුල් කිරීමේ ii වන අදියර ව්‍යාපෘතියත් සමඟ සමස්ථ මගී මෙහෙයුම් ධාරිතාවය 2020 වන විට මිලියන 15 ක් දක්වා ඉහළ යනු ඇත.<br><br>දෙවන ජාත්‍යන්තර ගුවන්තොටුපල මත්තල ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් කැපීපෙනෙන ආයෝජනයක් සිදුකර ඇත. කෙසේ වෙතත් පසුගිය වසර කිහිපය තුල එය ප්‍රශස්ථ මට්ටමෙන් උපයෝජනය කර නොමැත. ඒ අනුව මෙය ආර්ථිකමය වත්කමක් කිරීම සඳහා සුදුසු හවුල්කරුවකුගෙන් යෝජනා ලබාගැනීමේ ක්‍රියාවලිය රජය විසින් මේ වන විට දියත් කර ඇත.<br><br>2016 වර්ෂය තුල ගුවන්යානා මෙහෙයුම් සියයට 10.5 කින් 62,039 ක් දක්වා වැඩිවී ඇති අතර ගුවන් මගීන් මෙහෙයවීම් (භුවමාරු මගීන් ඇතුළුව) සියයට 11.7 කින් වැඩි වී ඇත. | 2025 වන විට පුරෝකථනය කර ඇති ඉල්ලුම් සපුරාලීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම විසින් අවශ්‍ය ආයෝජන සිදු කළ යුතු බව දක්වා ඇත. එබැවින් බණ්ඩාරනායක ගුවන්තොටුපල ii වන අදියර සංවර්ධන ව්‍යාපෘතිය කඩිනම් කිරීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කෙරේ.<br><br>යෝජිත මඩකලපුව හා බදුල්ල අභ්‍යන්තර ගුවන්තොටුපලවල ගුවන්තොටුපල මෙහෙයුම්කරු හා ගුවන් සේවා සැපයුම්කරු ලෙස ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම කටයුතු කල යුතු බවට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර ඇත. |
| ශ්‍රී ලංකා ගුවන් සමාගම | අනාර්ථික මෙහෙයුම් ප්‍රතිඵල සලකා බලා 2016 සහ 2017 මූල්‍ය වසර වල භාරදීමට නියමිතව තිබූ ගුවන් යානා හතරක ගිවිසුම් (A 350 – 900 ගුවන් යානා) අවලංගු කිරීම සඳහා වූ වැදගත් තීරණයක් ශ්‍රී ලංකා ගුවන් සමාගම විසින් ගෙන ඇත.<br><br>රජයේ තීරණයක් අනුව මිහින් ලංකා ගුවන් සමාගමේ මෙහෙයුම් කටයුතු ශ්‍රී ලංකා ගුවන් සමාගම වෙත 2016 ඔක්තොම්බර් මස 10 වන දින සිට ඒකාබද්ධ කර ඇත.<br><br>ශ්‍රී ලංකා ගුවන් සමාගම ලාභදායී ආයතනයක් ලෙස පරිවර්තනය කිරීම සඳහා කොටස් ප්‍රාග්ධනය මෙන්ම කළමනාකාරීත්ව පාලනය ලබාදෙමින් සමාගම ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ ක්‍රියාවලිය තුල රජය මේ වන විට නිරතව සිටී. | අඛණ්ඩව මෙහෙයුම් අලාභ ලබන තත්වයක් තිබියදීත් ශ්‍රී ලංකා ගුවන් සමාගම 2016 වර්ෂයේ මුළු ගුවන් මගී මෙහෙයවීම් වලින් 50% කට වඩා වැඩි වෙළඳපල කොටස් දරමින් ගුවන් සේවා අංශය තුල ප්‍රධානතම සේවා සැපයුම්කරු ලෙස කටයුතු කර ඇත. රටේ සංචාරක කර්මාන්තය සමඟ ඍජු සම්බන්ධතාවක් පවතින ශ්‍රී ලංකා ගුවන් සමාගම ඉතා වැදගත් ආයතනයක් ලෙස හඳුනාගෙන ඇත.<br><br>සංචාරක අංශයේ වැදගත් කම සලකා ශ්‍රී ලංකා ගුවන් සමාගම උපායමාර්ගික වැදගත්කමක් ඇති ආයතනයක් වන බැවින් රාජ්‍ය පෞද්ගලික ව්‍යාපාර ක්‍රමවේදයකදී පවා වැදගත් පාලන බලතල රජය වෙත තබා |

| අංශය | රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්යසාධනය | ලබා දුන් නිර්දේශ/ගත යුතු ක්‍රියාමාර්ග |
|---|---|---|
| | මහා භාණ්ඩාගාරය විසින් ශ්‍රී ලංකා ගුවන් සමාගම සහ මිහින් ලංකා සමාගම සඳහා තම ණය සුරක්ෂණය කිරීම වෙනුවෙන් අවශ්‍ය සහන ලිපි රාජ්‍ය බැංකු සඳහා නිකුත් කර ඇත. | ගැනිම අවශ්‍ය බව අවධාරණය කෙරේ.<br><br>නව ව්‍යාපාරික ක්‍රමවේදය භාණ්ඩාගාරයට කිසියම් මුල්‍ය වැය බරක් ඇති නොකරන එකක් විය යුතුය.<br><br>මහා භාණ්ඩාගාරය විසින් ලබා දි ඇති උපදෙස් අනුව ශ්‍රී ලංකා ගුවන් සමාගමේ ව්‍යාපාරික ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය 2017 ජුනි මස අගදී අවසන් කල යුතුව ඇත. |
| මිහින් ලංකා (පුද්) සමාගම | 2016/10/30 සිට බලපැවැත්වෙන පරිදි මිහින් ලංකා සමාගමේ සියළු ගුවන් ගමන් ජාලය සහ ගුවන් යානා දෙක ශ්‍රී ලංකන් ගුවන් සමාගම සමඟ ඒකාබද්ධ කර ඇත. මේ වන විට මිහින් ලංකා සමාගම කිසිදු ගුවන් මෙහෙයුම් කටයුත්තක නිරත නොවේ.<br><br>එහි සේවකයන්ගෙන් 124 දෙනෙකු ශ්‍රී ලංකන් ගුවන් සමාගමට අන්තර්ග්‍රහනය කර ඇති අතර තවත් 168 දෙනෙකු රජයෙන් ලබා දුන් වන්දි ක්‍රමයක් මත සේවයෙන් ඉවත් වී ඇත. | කිසිදු ව්‍යාපාරික කටයුත්තකින් තොරව මිහින් ලංකා සමාගම පැවතීම මගින් එහි වගකීම තවදුරටත් වැඩිවීමට හේතු විය හැකි අතර අවසානයේ එය භාණ්ඩාගාරයට බරක් විය හැක. ඒ අනුව මිහින් ලංකා ගුවන් සමාගමේ කටයුතු සම්බන්ධයෙන් ඉක්මන් ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කරන අතර අවසන් තීරණය කැබිනට් මණ්ඩලය විසින් ගත යුතුව ඇත. |
| **වරාය**<br><br>ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 2016 වර්ෂය තුළදී වරාය අධිකාරියේ සමස්ථ ආදායම රු. බිලියන 44 දක්වා ඉහළ ගොස් ඇති අතර එය 2015 වසරේ ආදායම වූ රු. බිලියන 40.8 සමග සැසඳීමේදී සියයට 8 ක වර්ධනයකි.<br><br>ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ඉහළ ධාරිතාවකින් යුත් උපකරණ හඳුන්වා දීම සහ නව ටර්මිනල් මෙහෙයුම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම මගින් නැවක් සියලු කටයුතු අවසන් කිරීම සඳහා ගත කරනු ලබන කාලය (turnaround time) ක්‍රමක්‍රමයෙන් අඩු කර ගැනීමට හැකියාව ලැබී ඇත.<br><br>හම්බන්තොට වරාය ව්‍යාපෘතියේ අදියර II සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය විසින් වර්ෂය තුළදී රු. මිලියන 893 ක් වැය කර ඇති අතර 2017 වර්ෂය තුළදීද එම වන්දි ගෙවීම් වෙනුවෙන් රු. මිලියන 1,000 ක් වැය කිරීමට අපේක්ෂිතය. එසේම යාපන අර්ධද්වීපයේ සහ උප නගරාශ්‍රිත ප්‍රදේශයන්හි ජැටි පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා 2016 වසර තුළදී රු. මිලියන 14.5 ක් වැය කර ඇත. මෙම ව්‍යාපෘතියද 2017 වර්ෂය තුළද ක්‍රියාත්මක වේ. | පුද්ගලික අංශය සමග තරඟකාරී ලෙස කටයුතු කිරීම සඳහා නැවක් සියලු කටයුතු අවසන් කිරීමට ගත කරනු ලබන කාලය (turnaround time) තවදුරටත් අවම කර ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය කටයුතු කළ යුතුය.<br><br>2016.12.31 වන විට වරාය අධිකාරියේ සමස්ථ ණය වගකීම් ප්‍රමාණය රු. බිලියන 237 ක් විය. එබැවින් ක්‍රමවත් ණය ස්ථායීකරණයක් සඳහා යෝග්‍ය ණය කළමනාකරණ වැඩපිළිවෙලක් වරාය අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීම සුදුසු වේ.<br><br>2016 වර්ෂය තුළදී එක්සත් ජනපද ඩොලරයට සහ ජපන් යෙන් වලට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීමේ ප්‍රතිඵලයක් ලෙස වරාය අධිකාරියට රු. බිලියන 10 ක විදේශ විනිමය අලාභයක් දැරීමට සිදු විය. ඒ අනුව 2016 වර්ෂය අවසන් වන විට අධිකාරියේ ශුද්ධ ලාභය රු. බිලියන 01 කි. එබැවින් යටිතල පහසුකම් හා වෙනත් පහසුකම් වැඩි කිරීමෙන් මෙහෙයුම් ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතාව හා ඵලදායීතාව වර්ධනය කිරීම හරහා ආයතනයේ පිරිවැටුම ඉහළ නංවා ගැනීමට වරාය අධිකාරිය විසින් කඩිනම් ප්‍රමුඛ ක්‍රියාමාර්ග ගත යුතුය. |

| අංශය | රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්යසාධනය | ලබා දුන් නිර්දේශ/ගත යුතු ක්‍රියාමාර්ග |
|---|---|---|
| **ඉදිකිරීම් අංශය**<br><br>රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව<br><br>ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය<br><br>රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | ආර්ථික කළමණාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුවේ නිර්දේශ පරිදි, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ලැබිය යුතු මුදල් අය කර දීම සඳහා රැස්වීම් මාලාවක් පවත්වන ලදී. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ වර්තමාන තත්වය පැහැදිලි කරමින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට මෙම දෙපාර්තමේන්තුව විසින් කටයුතු කළ අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ කාරක ප්‍රාග්ධන ගැටළු වලට විසඳුමක් ලෙස ලංකා බැංකුවෙන් රු. මිලියන 750 ක ණයක් ලබා ගැනීමට භාණ්ඩාගාර ඇපකරයක් නිකුත් කරන ලදී.<br><br>රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ පොදු කාරක සභාව විසින් ලබා දුන් උපදෙස් පරිදි ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ සේවකයින් ප්‍රතිසංවිධානය කර එම ආයතනයට හා එහි පරිපාලිත ආයතනයක් වන මධ්‍යම ඉංජිනේරු සේවා සමාගමට සේවකයන් වෙන් කිරීම සඳහා කටයුතු කර ඇත. | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව විසින් නවීන තාක්ෂණය උපයෝජනය වර්ධනය කර ගත යුතු අතර පරිසර හිතකාමී සහ පිරිවැය අවම කර ගත හැකි නවීන ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතා කරමින් නව ඉදිකිරීම් භාවිතයන් කෙරෙහි යොමු විය යුතුය.<br><br>නවීන යන්ත්‍රෝපකරණ සඳහා ආයෝජනයන් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| **බැංකු අංශය**<br><br>ලංකා බැංකුව<br><br>මහජන බැංකුව<br><br>ජාතික ඉතිරි කිරීමේ බැංකුව<br><br>ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව<br><br>නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව<br><br>රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව<br><br>ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව<br><br>ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 2016 වසර තුළදී, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය පවත්වා ගැනීම සඳහා හිමිකම් නොපෑ තැන්පතු උපයෝගී කර ගනිමින් රු. බිලියන 3 ක වටිනාකමකින් යුතු කොටස් නිකුත් කරන ලදී. ලංකා බැංකුව වෙත ඉදිරියේදී කොටස් ලෙස නිකුත් කිරීමේ හැකියාවකින් යුතු රු. බිලියන 05 ක වටිනාකමකින් යුත් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කර ඇත.<br><br>දේශීය හා විදේශීය වෙළඳපළ වෙත පුළුල් ප්‍රවේශයක් ඇති කිරීමටත්, ඉහළ ශ්‍රේණිගත කිරීම් ලබා ගැනීමටත් හැකි වන සේ රාජ්‍ය බැංකු වල ශේෂ පත්‍රයන් ශක්තිමත් කිරීමට අවශ්‍ය යෝජනා 2016 අයවැය යෝජනාවලියට ඇතුළත් කර ඇත. මේ යටතේ, නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුව හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ඒකාබද්ධ කරමින් ශක්තිමත් හා විශාල “ජාතික නිවාස බැංකුව” පිහිටුවීමටත්, ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ඒකාබද්ධ කරමින් “ලංකා ව්‍යාපාර සංවර්ධන බැංකුව” පිහිටුවීමටත්, ජාතික ඉතිරිකිරීමේ බැංකුව හා ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව ඒකාබද්ධ කිරීමටත් යෝජනා කර ඇත. රාජ්‍ය ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශයට අනුව ඒකාබද්ධ කිරීමේ වැඩසටහන ආරම්භකර ඇත.<br><br>රාජ්‍ය බැංකු විසින් 2016 වසරේ රු. බිලියන 38 ක අයභාර හා රු. බිලියන 759 ක ලාභාංශ ගෙවා ඇත. | ක්ෂේත්‍රයේ තරඟකරුවන් සමඟ තරඟ කිරීමට නව තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කළ යුතුය.<br><br>ලංකා බැංකුව, මහජන බැංකුව හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව යන බැංකු වල ණය කළඹ විශාල වශයෙන් රාජ්‍ය ව්‍යවසායන් ඇතුළු රාජ්‍ය අංශය මත යැපෙන බැවින්, ආර්ථිකයේ සංවර්ධනය වන නවමු අංශ වෙත ණය පහසුකම් සැපයීමේ හැකියාව හා නිෂ්පාදන කළඹ විවිධාංගීකරණය කිරීමේ හැකියාව අවහිර වී ඇත.<br><br>ණය ගුණාත්මකභාවය හා ණය ආපසු අයකර ගැනීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම.<br><br>ආර්ථිකයේ නව වැඩි දියුණු වන ක්ෂේත්‍ර හඳුනාගෙන එම ක්ෂේත්‍ර වෙත ණය යොමු කිරීම.<br><br>ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව හා ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව, බැංකුකරණ ආදායමට වඩා ආයෝජන ආදායම මත විශාල වශයෙන් යැපෙන බැවින් ණය කළඹ වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| අංශය | රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්යසාධනය | ලබා දුන් නිර්දේශ/ගත යුතු ක්‍රියාමාර්ග |
|---|---|---|
| **අලෙවිය හා බෙදාහැරීම**<br><br>හොටෙල් ඩිවලොපර්ස් ලංකා පීඑල්සී සමාගම | හොටෙල් ඩිවලොපර්ස් ලංකා සමාගමේ 2014/15 වර්ෂයේ වාර්තා කළ රු. මිලියන 2,018 ක ආදායම 2015/16 වර්ෂයේ රු. මිලියන 2,540 ක් දක්වා සියයට 25.8 කින් වැඩි වී ඇත.<br><br>2014/15 වර්ෂයේ වාර්තා කළ රු. මිලියන 77 ක ලාභය හා සසඳන විට හොටෙල් ඩිවලොපර්ස් ලංකා සමාගම 2015/16 වර්ෂයේ රු. මිලියන 203 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත. | දෙස් විදෙස් සංචාරකයින් ආකර්ශණය කර ගැනීම සඳහා සෑම ස්ථරයකටම සරිලන පරිදි පහසු මිල පැකේජ නිර්මාණය කළ යුතුය. |
| ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) | ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය 2015 වර්ෂයේ වාර්තා කළ රු. මිලියන 21.91 ක අලාභය 2016 වර්ෂයේදී රු. මිලියන 4.48 ක ලාභයක් බවට පත් කරගෙන ඇත.<br><br>ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය 2015 වර්ෂයේ වාර්තා කළ රු. මිලියන 788 ක ආදායම 2016 වර්ෂයේදී රු. මිලියන 787 ක් දක්වා සියයට 0.1 කින් අඩු වී ඇත.<br><br>බදු පෙර ලාභය වැඩිවීම කෙරෙහි මණ්ඩලයේ විකුණුම් පිරිවැය සහ පරිපාලන වියදම් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.<br><br>ණය පොළී සහ වාරික ලෙස රු. මිලියන 129 ක් ගෙවීම හේතුවෙන් ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2016 වර්ෂයේ මූල්‍ය පිරිවැය ඉහළ ගොස් ඇත. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය "අපේ ගම" ඉදිකිරීම් කටයුතු සඳහා රු. මිලියන 199.4 ක ණය මුදලක් ලබාගෙන ඇත. එම ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය මුදලට අමතරව මණ්ඩලයේ මුදල් වූ රු. මිලියන 21.6 ද ඇතුළුව රු. මිලියන 221 ක මුළු පිරිවැයක් දරා ඇත.<br><br>2015 දෙසැම්බර් මස "අපේ ගම" ගැසට් නිවේදනයක් මඟින් අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පවරා දෙන ලද අතර එබැවින් "අපේ ගම" ව්‍යාපෘතිය තුළින් හස්ත කර්මාන්ත මණ්ඩලයට කිසිදු ආදායමක් නොලැබේ.<br><br>මණ්ඩලය විසින් ණය මුදල පියවීම සඳහා ණය පොලියද ඇතුළුව රු. මිලියන 3.9 ක් වූ මාසික වාරිකයක් ගෙවන අතර මෙය මණ්ඩලයට අතිරේක බරක්ව ඇත.<br><br>ශ්‍රී ලංකා කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත මණ්ඩලය විසින් පිරිනමනු ලබන 2016 වර්ෂයේ කාර්මික විශිෂ්ඨතා සම්මානය දිනා ගැනීමට ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය සමත් විය. | "ලක්සල" සන්නාමය යටතේ හස්ත කර්මාන්ත නිෂ්පාදන සඳහා සුවිශේෂී වෙළෙඳපොළක් නිර්මාණය කිරීම. නිෂ්පාදන වර්ගීකරණයන් ස්ථාපනය කිරීම සහ පුළුල් කිරීම.<br><br>දෙස් විදෙස් ගැණුම්කරුවන් ආකර්ශණය කරගැනීම සඳහා නවීන පහසුකම් සහිතව වෙළෙඳ කුටි අළුත්වැඩියා කිරීම.<br><br>ප්‍රසාරණය වෙමින් පවතින සංචාරක ක්ෂේත්‍රයෙන් උපරිම ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා සංචාරකයින් බහුල ප්‍රදේශවල අලෙවි කුටි ස්ථාපිත කිරීම සඳහා උපායමාර්ග යෙදීම.<br><br>ආයතනයේ වෙළෙඳපොළ කොටස වැඩිකර ගැනීමට හා තිරසාරත්වය රැකෙන පරිදි සුදුසු උපායමාර්ගික සැලැස්මක් නිර්මාණය කළ යුතුය.<br><br>ගොඩනැගිලි කුලී අඩුකර ගැනීම සඳහා සුදුසු පියවර ගත යුතු වේ.<br><br>විමර්ශනයකින් අනතුරුව ආයෝජන මත ප්‍රතිලාභ නොලබන අලෙවි කුටි වසා දැමීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |
| සී/ස ලංකා සතොස | 2011 වර්ෂයේ සිට 2016 වසර දක්වා සිදුකළ අලෙවිසැල් ව්‍යාප්ත කිරීමේ වැඩසටහන හේතුවෙන් ලංකා සතොස ආයතනය සැළකිය යුතු වර්ධනයක් | මේ අනුව ලංකා සතොස මුහුණපා ඇති හදිසි අවශ්‍යතාවය වන්නේ නව්‍ය ව්‍යාපාර සම්පත් සැළසුම්කරණ පද්ධතියක් හඳුන්වා දෙන |

| අංශය | රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්යසාධනය | ලබා දුන් නිර්දේශ/ගත යුතු ක්‍රියාමාර්ග |
|---|---|---|
| | ලබා කර ගෙන ඇත. කෙසේ වෙතත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ වූ නීතිමය ගැටළුවල ප්‍රතිඵලයක් ලෙස ආනයනය කරන ලද සහල් තොග යල් පැනීම හේතුවෙන් අඩු මිලකට විකිණීමට සිදුවීම, 2015 වර්ෂයේ රු. මිලියන 1,259 ක් වූ සමාගමේ ශුද්ධ ලාභය 2016 වර්ෂයේ රු. මිලියන 4,805 ක ශුද්ධ අලාභයක් බවට පත්වී සමාගමේ මූල්‍ය පසුබෑම ආරම්භ වීමට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත. මෙම ගැටළුවල ප්‍රතිඵලයක් ලෙස ලංකා සතොස ආයතනය අලෙවිසැල් මට්ටමින් ප්‍රමාණවත් තොග නොමැතිව ද්‍රවශීලතා ගැටළුවක් කරා ගමන් කරයි. | තෙක් දැනට පවතින තොරතුරු පද්ධතිය සමස්ත ශාඛා, ගබඩා හා ප්‍රධාන කාර්යාලය ආවරණය වන පරිදි පුළුල් කිරීමයි. තවදුරටත් සේවකයන් අතර රාජකාරි වෙන්කර දී ඔවුන්ට අදාළ මෙහෙයුම් බලය සහ වගකීම ලබා දීම තුළින් නිසි අභ්‍යන්තර පාලන ක්‍රියාමාර්ග හඳුන්වා දීම අවශ්‍ය වේ. නිපුණ විගණන කාර්ය මණ්ඩලය වැඩි කිරීම හා අවශ්‍ය සම්පත් සැපයීම මගින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීමද යහපාලනය වැඩි දියුණු කිරීම සඳහා ඉතා වැදගත් අවශ්‍යතාවයකි. සතොස ආයතනය විසින් හඳුන්වා දෙන ලද මූලික කාර්යසාධක දර්ශක මත පදනම් වූ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා වූ වැඩසටහන ඇගයිය යුතු තීරණයක් වුවත් දරන ලද පිරිවැය සහ ක්‍රියාත්මක කිරීමට ගතවන කාලය මුදල් සඳහා වටිනාකම අනුව සලකා බැලිය යුතු වේ. |
| ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව | පෙර වසර හා සංසන්දනය කරන විට 2016/2017 දී මුළු ආදායම සියයට 24 කින් අනුක්‍රමිකව වර්ධනය වී ඇත. මෙයට ප්‍රධාන හේතු වන්නේ සලකා බලන වර්ෂය තුළ ආයතනය විසින් අනුගමනය කරන ලද පිරිවැය අඩු කිරීමේ ක්‍රමවේද, රාජ්‍ය අංශයේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිදුවූ වර්ධනයත් සමඟ රසායන ද්‍රව්‍ය ආදිය සඳහා ඉල්ලුම ඉහළ යාම හා තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ උපකරණ සඳහා වූ ඉල්ලුම වැඩි වීම ආදියයි. එසේම ගෘහ උපකරණ ආශ්‍රිත වෙළඳපොළ කටයුතුද මෙම වසර තුළ සාර්ථක වී ඇත. මෙම සියල්ලෙහි ප්‍රතිඵලයක් ලෙස සලකා බලන ලද වසර තුළ රු.මි. 35 ක බදු පෙර ලාභයක් වාර්තා කිරීමට ආයතනය සමත්වූ අතර, මෙය පෙර වර්ෂය හා සසඳන විට සියයට 40 ක වර්ධනයකි. | වෙළඳපොළ අවස්ථාවන් අනුව ඉදිරිපත් කළ හැකි නිෂ්පාදනයන් හඳුනා ගැනීම හා එම නිෂ්පාදන වල වෙළෙඳ නාමයන් වර්ධනය කිරීම සඳහා සුදුසු උපාය මාර්ගයන් හඳුනා ගැනීම තුළින් රාජ්‍ය අංශයේ වෙළඳපළ ව්‍යාපාරික අවධානම අඩු කළ හැකි පරිදි හා පෞද්ගලික අංශය අභිබවා යන ආකාරයට ආයතනයේ පොදු නිෂ්පාදන සඳහා නව උපාය මාර්ගයන් යොදවා ගැනීම. මෙම වෙළඳපොළවල තම සන්නම් නාමය ප්‍රවර්ධනය කිරීම සඳහා උපාය මාර්ග සැකසිය යුතුය. නාරාහේන්පිට ආරම්භ කිරීමට යෝජිත මෙගා වෙළෙඳසැල් (showroom) වැනි ආයෝජනයන් නිසි ලෙස කළමනාකරණය කිරීම තුළින් ආයතනයේ නිෂ්පාදන විවිධාංගීකරණය කිරීමට අවශ්‍ය පියවර ගැනීම. |
| රාජ්‍ය මුද්‍රණ සංස්ථාව | පාසැල් පෙළපොත් හා අනෙකුත් මුද්‍රණ කටයුතු වර්ධනය වීම හේතුවෙන් රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ ආදායම සියයට 14 කින් ඉහළ ගොස් ඇත. ඒ අනුව 2015 වසරේ රු. මිලියන 3 ක් වූ බදු පෙර ලාභය 2016 වසර තුළදී රු. මිලියන 4.6 ක් දක්වා වර්ධනය වී ඇත. 2015 වසරේදී මාස 4.5 ක් වූ තොග රඳවා තබා ගැනීමේ කාල සීමාව 2016 වසරේදී මාස 2.5 දක්වා අඩු කර ගැනීමට රාජ්‍ය මුද්‍රණ සංස්ථාවට හැකි විය. තවද, 2015 වසරේදී මාස 6.1 ක් වූ ණය අය කර ගැනීමේ කාලය, 2016 වසර තුළදී මාස 5.8 දක්වා අඩු කර ගෙන ඇත. ඒ අනුව සමස්තයක් | පිරිවැය අඩු කර ගනිමින් ලාභදායකත්වය වැඩි කර ගැනීම සඳහා කාරක ප්‍රාග්ධන කළමනාකරණය තවදුරටත් විධිමත්ව පවත්වාගෙන යාමට රාජ්‍ය මුද්‍රණ සංස්ථාව පියවර ගත යුතුයි. තවද, ආයතනයේ මධ්‍ය කාලීන ලාභදායිත්ව ඉලක්ක ලබා කර ගැනීම උදෙසා වඩාත් කාර්යක්ෂමව පිරිවැය කළමනාකරණය, නිෂ්පාදන ධාරිතාව උපරිම ලෙස උපයෝගී කර ගැනීම හා වෙළඳපොළ කොටස වර්ධනය කර ගැනීම වැනි උපායමාර්ග අනුගමනය කළ යුතුය. |

| අංශය | රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්යසාධනය | ලබා දුන් නිර්දේශ/ගත යුතු ක්‍රියාමාර්ග |
|---|---|---|
| | ලෙස පසුගිය වසර හා සැසඳීමේදී 2016 වසර තුළ කාරක ප්‍රාග්ධන කළමනාකරණය සතුටුදායක ලෙස පවත්වා ගෙන යාමට රාජ්‍ය මුද්‍රණ සංස්ථාව සමත්ව ඇත. | |
| රාජ්‍ය දැව සංස්ථාව | රාජ්‍ය දැව සංස්ථාව 2015 වර්ෂයේදී වාර්තා කළ රු. මිලියන 3,836 ක අදායමට සාපේක්ෂව 2016 වර්ෂයේදී සිය ආදායම රු. මිලියන 4,213 ක් දක්වා සියයට 9.8 ක ප්‍රතිශතයකින් වැඩි කර ගැනීමට සමත් වී ඇත. අලෙවි ආදායම සඳහා ආසන්න වශයෙන් සියයට 60 ක පමණ ප්‍රතිශතයකින් දැව කඳන් දායකත්වය දක්වනු ලබයි.<br><br>රාජ්‍ය දැව සංස්ථාව සිය ලාභදායීත්වය දිගින් දිගටම පවත්වාගෙන ගිය අතර 2016 වර්ෂයේදී රු. මිලියන 83 ක ලාභදායීත්වයක් වාර්තා කළද එය 2015 වර්ෂයේදී වාර්තා කළ ලාභයට වඩා සියයට 77 කින් අඩු වී ඇත.<br><br>2015 වර්ෂයේදී රාජ්‍ය දැව සංස්ථාවේ මුළු පිරිවැය රු. මිලියන 1,284 ක් වූ අතර එය 2016 වර්ෂය වන විට රු. මිලියන 1,691 ක් දක්වා සියයට 32 කින් වැඩි වී ඇත.<br><br>රාජ්‍ය දැව සංස්ථාවේ විකුණුම් පිරිවැය, අලෙවි ආදායමෙන් සියයට 52 ක් වූ අතර 2016 වර්ෂයේ දළ ලාභය රු. මිලියන 2,307 ක් විය.<br><br>විශේෂ අයබදු වශයෙන් ගෙවන රු. මිලියන 100 ද ඇතුලත්ව රු. මිලියන 176 ක අයබදු ප්‍රමාණයක් 2016 වර්ෂය තුළදී මහා භාණ්ඩාගාරයට ගෙවා ඇත. | දැව කඳන් විකිණීම සඳහා මිල සූත්‍රයක් හඳුන්වාදීමට උපදෙස් ලබා දී ඇත.<br><br>කාර්ය මණ්ඩල සංශෝධනයක් සිදු කිරීම හා යෝග්‍ය බඳවා ගැනීම් ප්‍රතිපත්තීන් හඳුන්වාදීම තුළින් සමබර කාර්යය මණ්ඩල ප්‍රමාණයක් පවත්වාගෙන යාමද ඇතුළුව රාජ්‍ය දැව සංස්ථාව සිය පිරිවැය අවම කරගනිමින් ආයතනයේ ලාභදායීත්වය වැඩිකර ගැනීම සඳහා සුදුසු උපායමාර්ග අනුගමනය කළ යුතුය.<br><br>ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා උපායමාර්ගික සහයෝගිතාවයන් ගොඩ නගා ගැනීම.<br><br>වඩා විශාල ලාභාන්තිකයක් ලබාදෙන සහ විශේෂිත වෙළෙඳපොළ ඉල්ලුම් සපුරාලන පරිසර හිතකාමී නිෂ්පාදන කෙරේ අවධානය යොමු කරමින් කර්මාන්තයේ ශක්‍යතාවය තහවුරු කරගත හැකිවන පරිදි නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| **රක්ෂණ අංශය**<br><br>ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සාමාන්‍ය රක්ෂණය සඳහා සියයට 20 ක වෙළඳපළ කොටසක් සහිතව රක්ෂණ වෙළඳපළ තුළ ප්‍රමුඛස්ථානයක් උසුලන අතර ජීවිත රක්ෂණය සඳහා සියයට 19 ක වෙළඳපළ කොටසක්ද හිමිකර ගනිමින් 2016 වසරේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මුළු ආදායම ලෙස රු. මිලියන 42,049 ක් වාර්තා කර ඇත. එය පසුගිය වසරේ මුළු ආදායම වූ රු. මිලියන 31,156 ට සාපේක්ෂව සැලකිය යුතු වර්ධනයකි. 2016 වසරේ දළ ලිඛිත වාරික වල වටිනාකම සියයට 12.5 ක වර්ධනයක් වාර්තා කරමින් රු. මිලියන 27,594 දක්වා ඉහළ ගොස් ඇත. | පාරිභෝගික හැසිරීම් රටාවන්ගේ වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් හා රටේ කර්මාන්ත, කෘෂිකර්ම හා සේවා අංශයන්ගේ අවශ්‍යතාවයන් සපුරාලන පරිදි නව්‍යතාවයකින් යුත් නිෂපාදන හඳුන්වාදෙමින් සමාගමේ වාණිජමය අපේක්ෂාවන් සුරක්ෂිත කිරීම. |
| ජාතික රක්ෂණ භාර අරමුදල | ජාතික රක්ෂණ භාර අරමුදලේ දළ ලිඛිත ආදායම 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී රු. මිලියන 6,732 දක්වා සියයට 33 කින් වර්ධනය වී ඇත. 2015 වර්ෂයේදී රු. බිලියන 3.2 ක් වූ මුළු හිමිකම් ඉල්ලීම් 2016 වර්ෂයේ රු. බිලියන 5.2 දක්වා සියයට 66 කින් ඉහළ ගොස් ඇත. | නවීන ජීවන රටාව අනුව පැන නගින වෙළඳපළ අවශ්‍යතා වෙත යොමු වෙමින් පාරිභෝගික අවශ්‍යතාවයන් සඳහා අනුකූල වන වඩාත් හොඳ නිෂ්පාදනයන් සංවර්ධනය කළ යුතුය. |

| අංශය | රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්යසාධනය | ලබා දුන් නිර්දේශ/ගත යුතු ක්‍රියාමාර්ග |
|---|---|---|
| **පශු සම්පත් අංශය**<br><br>මිල්කෝ (පුද්ගලික) සමාගම | 2016 වර්ෂයේ අයවැය මගින් දේශීය කිරිපිටි මිල අඩු කරන ලද අතර මෙසේ මිල අඩු කිරීම නිසා මිල්කෝ සමාගමට දැරීමට සිදුවන පාඩුව භාණ්ඩාගාරය විසින් ප්‍රතිපූරණය කරනු ලබයි.<br><br>තරඟකාරී ලෙස අනෙකුත් නිෂ්පාදන වල මිල ගණන් සංශෝධනය කිරීම තුළින් මිල්කෝ සමාගමේ ලාභය වැඩි කර ගැනීමට භාණ්ඩාගාරය විසින් මිල්කෝ සමාගම වෙත පහසුකම් සලසා දී ඇත.<br><br>මිල්කෝ සමාගමට යූරෝ මිලියන 33.8 ක සහ යූරෝ මිලියන 64 ක ණය මුදල් දෙකක් ලබා ගැනීම සඳහා භාණ්ඩාගාරය විසින් පහසුකම් සලසා දෙන ලදී. එම ණය මුදල් දෙකෙන් පළමු ණය මුදල (යූරෝ මිලියන 34 ක) අඹේවෙල, දිගන හා පොළොන්නරුව යන කිරි කර්මාන්තශාලා 03 නවීකරණය සඳහා යෙදවූ අතර මේ වන විට ඉන් කර්මාන්තශාලා දෙකක වැඩ අවසන්ව ඇත. අඹේවෙල කර්මාන්තශාලාවේ නවීකරණ කටයුතු 2017 ජූනි මාසය අවසාන වන විට නිම කිරීමට යෝජිතය. නාරාහේන්පිට පිහිටි කිරි කර්මාන්තශාලාව බඩල්ගම ස්ථාපනය කිරීම සඳහා දෙවන ණය මුදල ලබාගෙන ඇති අතර එහි වැඩ කටයුතු මේ වන විට කරගෙන යමින් පවතී. | වෙළෙඳපොළ නියෝජිතයන් දිරි ගැන්වීම තුළින් දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය කොට දැනට සපුරාලීමට නොහැකිවූ ඉල්ලුම වඩා හොඳින් සපුරාලීමට ක්‍රියා කිරීම.<br><br>අවිධිමත් සහ සාම්ප්‍රදායික කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන වෙළඳපොළ හඳුනා ගැනීම හා එම වෙළඳපොළ විධිමත් කිරීම සඳහා සුදුසු හා ඵලදායී වෙළඳපොළ යාන්ත්‍රණයක් හඳුන්වාදීම.<br><br>මහජනයා අතර දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම. |
| ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | ව්‍යාපෘතියේ දෙවන පියවර ලෙස ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට ඉහළ ඵලදාවෙන් යුත් තවත් දෙනුන් 2,500 ක් ආනයනය කිරීමට ඇමෙරිකානු ඩොලර් මිලියන 20 ක ණය මුදලක් ලබා ගැනීමට මහා භාණ්ඩාගාරය පහසුකම් සලසා දී ඇත. එසේ ආනයනයන කරන ලද දෙනුන් රිදියගම ගොවිපළෙහි ස්ථාපනය කොට ඇත.<br><br>ඉහළ ඵලදාවෙන් යුත් දෙනුන් ස්ථාපනය කිරීමත් සමඟම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කිරි නිෂ්පාදනය දිනකට ලීටර් 28,000 සිට ලීටර් 40,000 දක්වා ඉහළ ගොස් ඇත. | ආනයනය කරන ලද අධි ඵලදාවෙන් යුත් දෙනුන්ගෙන් ලබා ගන්නා පැටවුන් යොදාගෙන ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් නව ගව ගොවිපළවල් ඇති කළ යුතුය. |
| **වැවිලි අංශය**<br>ජනතා වතු සංවර්ධන මණ්ඩලය<br><br>ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව<br><br>හලාවත වැවිලි සමාගම<br><br>කුරුණෑගල වැවිලි සමාගම | ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, හලාවත, කුරුණෑගල, ඇල්කඩුව වැවිලි සමාගම්, කජු සංස්ථාව හා කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම දැනට මෙරට වැවිලි අංශයේ ක්‍රියාත්මක වන රජය සතු ව්‍යවසායන් වන අතර ප්‍රාදේශීය වැවිලි සමාගම් 18 හි සෑම සමාගමකටම රන් කොටසක් බැගින් රජය සතු වේ.<br><br>කළුබෝවිටියාන, කජු සංස්ථාව හා සීනි සමාගම තම බදු පෙර ලාභයේ වර්ධනයක්ද, කුරුණෑගල, හලාවත යන වැවිලි සමාගම් බදු පෙර ලාභයේ ආන්තික පහළ යාමක්ද වාර්තා කොට ඇති අතර ශ්‍රී | නිෂ්පාදන පිරිවැය පහළ දැමීම හා අස්වැන්න ඉහළ නංවා ගැනීමේ අරමුණ ඇතිව ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කොට ඇත. |

| අංශය | රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්යසාධනය | ලබා දුන් නිර්දේශ/ගත යුතු ක්‍රියාමාර්ග |
|---|---|---|
| ඇල්කඩුව වැවිලි සමාගම<br>කපු සංස්ථාව<br>කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම<br>ප්‍රාදේශීය වැවිලි සමාගම<br>ලංකා සීනි සමාගම | ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව තම අලාභය සියයට 34.46 කින් අඩු කර ගැනීමට සමත් වී ඇත. වැවිලි අංශයේ මෙම ප්‍රවනතාවයෙන් වෙනස්ව ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ අලාභය සියයට 7.26 කින් ඉහළ ගොස් ඇත. මෙම වැවිලි ආයතන වාණිජමය වශයෙන් ශක්‍ය ලෙස පවත්වා ගැනීම සඳහා රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය ඒවා ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටී. | |
| **පුනර්ජනනීය නොවන සම්පත්**<br>ලංකා ඛණිජ වැලි සමාගම<br>කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම<br>ලංකා පොස්ෆේට් සමාගම | වාර්ෂික මහසභා රැස්වීම්වලට සහභාගී වෙමින් වාර්ෂික වාර්තාවන්හි අඩුපාඩු පෙන්වා දෙන ලද අතර රාජ්‍ය ව්‍යාපාරයන්හි යහපාලනය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් අනුගමනය කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | ලංකා ඛණිජ වැලි සමාගමට අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් නොකිරීම සම්බන්ධයෙන් ජනාධිපති ලේකම්, නීතිපති, සමාගම් රෙජිස්ට්‍රාර් සමඟ සාකච්ඡා කර ව්‍යවස්ථාපිත අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතුයි.<br>කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම ගැනුම්කරුවන් වර්ධනය කිරීම සහ නව වෙළඳපලට යොමු වීම සඳහා අලෙවි උපක්‍රම භාවිතා කළ යුතුයි.<br>නව ගැනුම්කරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා එකතු කළ අගය වර්ධනය කිරීමට කටයුතු කළ යුතුයි. |
